සැ.යු .- 2015.11.20 දින පළ වූ අංක 1942 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,943 - 2015 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2015.11.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 710 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 714 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 716 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 දෙසැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 393

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2013 ජනවාරි මස 21 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (අවි) වශයෙන් :*

ලුතිනන් (අවි) තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (අවි) ජයමුණි සංජය දිනේෂ් සිල්වා, එන්ආර්එක්ස් 1418, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) බ්‍රැන්ඩිවත්තගේ ඉෂාර චින්තක පෙරේරා, එන්ආර්එල් 1758, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

11 - 657/2

---

2015 අංක 394

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2014 ඔක්තෝබර් මස 24 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] හරිගම්පිටියගේ ඩිලාන් සාරංග ජයතිලක, එන්ආර්එස් 1700, ශ්‍රීලංනාහ

*2015 ජනවාරි මස 25 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] වීරරත්ත විදාන ආරච්චිගේ දිනිඳු සංජීව, එන්ආර්එක්ස් 2228, ශ්‍රීලංනාහ

*2015 පෙබරවාරි මස 12 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] ජසෙන්තු පටබැඳි චතුරංග ජයදූන් ද සිල්වා, එන්ආර්එක්ස් 1775, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] උඩුගම කෝරාලලාගේ බුද්ධි ධනුෂ්ක විජේසිංහ, එන්ආර්ඊ 2238 ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 09 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (කිමි) වශයෙන් :*

ලුතිනන් (කිමි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (කිමි] දිසානායක මුදියන්සේලාගේ රසික එරංග දිසානායක, එන්ආර්එක්ස් 1799, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] කුෂාන් වෙනුක් බෝගහවත්ත, එන්ආර්එල් 1757, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/6

---

2015 අංක 395

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීමක්

*2015 පෙබරවාරි මස 22 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (තොතා) වශයෙන් :*

ලුතිනන් (තොතා) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (තොතා)] දොන් යසිරු රංගන රණසිංහ වීරසේකර, එන්ආර්ටී 2427, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

11 - 657/1

2015 අංක 396

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීමක්

*2015 මැයි මස 07 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] විතානගේ අනුෂ්ක සංජීව පෙරේරා, එන්ආර්එල් 1792, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/7

---

2015 අංක 397

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2014 ජූලි මස 25 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] වික්‍රමආරච්චිලාගේ නලින් තරංග ලක්මාලි වික්‍රමආරච්චි, එන්ආර්එස් 1698, ශ්‍රීලංනාහ

*2015 පෙබරවාරි මස 08 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] අසංක රජින්ද තන්ත්‍රිගේ එන්ආර්ඊ 2229, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 12 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] මාදම්පගේ හසිත එරංග ද සිල්වා එන්ආර්එක්ස් 1794, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

11 - 657/4

---

2015 අංක 398

MOD/DEF/03/02/PRO/VNF/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2015 අගෝස්තු මස 04 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිනන් (ස්වේ) හේරත් මුදියන්සේලාගේ ජයන්ත කුමාර, එන්වීඑක්ස් 5373, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

11 - 658/3

---

2015 අංක 399

MOD/DEF/03/02/PRO/VNF/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2015 අගෝස්තු මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිනන් (ස්වේ) වික්‍රම ආරච්චි පත්තුවගේ රංජිත් කුමාර, එන්වීඑක්ස් 5376, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

11 - 658/2

2015 අංක 400

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2014 පෙබරවාරි මස 03 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් විජේසිංහලාගේ නිහාල් ලක්ෂ්මන් විජේසිංහ, එන්ආර්එක්ස් 2289, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/5

---

2015 අංක 401

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

*2015 ජනවාරි මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) කොස්ගල්ලන දූරගේ සුජිත් සරත්වීර, එන්ආර්ඊ 2272, ශ්‍රීලංනාහ

*2015 මැයි මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් සේනානායක පතිරන්නැහැලාගේ ඉරෝෂ් කමල් සේනානායක, එන්ආර්එක්ස් 2241, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

11 - 657/3

---

2015 අංක 402

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2015 පෙබරවාරි මස 26 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් කොස්වින්නගේ ජනක ප්‍රසාද් රෝහණ, එන්ආර්එක්ස් 2344, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/4

---

2015 අංක 403

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

*2015 අප්‍රේල් මස 23 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) දිනිත් ඉරෝෂ නානායක්කාර, එන්ආර්ඊ 2321, ශ්‍රීලංනාහ

*2015 මැයි මස 16 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් සමරකෝන් මුදියන්සේලාගේ සම්පත් මංගල කරුණාරත්න, එන්ආර්එක්ස් 2242, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/3

2015 අංක 404

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2015 මැයි මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් හේවා දේවගේ සචිත්‍ර ලංකා අබේසේකර, එන්ආර්එක්ස් 2245, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/1

---

2015 අංක 405

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

*2015 ජූනි මස 13 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් බාලසූරිය මුදියන්සේලාගේ ගැමුණු සුනිමල් ජයරත්න, එන්ආර්එක්ස් 2251, ශ්‍රීලංනාහ

*2015 ජූනි මස 13 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) සමරකෝන් මුදියන්සේලාගේ අසංක චන්දන බණ්ඩාර සමරකෝන්, එන්ආර්එස් 2269, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

11 - 656/2

---

2015 අංක 406

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2015 ජූලි මස 25 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් බැමිණහැන්නදිගේ දුමින්ද ප්‍රියදර්ශණ පීරිස්, එන්ආර්එක්ස් 2254, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

11 - 657/5

---

2015 අංක 407

D/RF/828/01/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට
පත් කිරීම්

2015 ඔක්තෝබර් මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම් සඳහන් නිලධාරීන් හට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ නිත්‍ය අධිකාරිය පිරිනැමීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් ඉදුමල් දෙවොලගේ, එන්ආර්එක්ස් 3001, ශ්‍රීලංනාහ
ලුතිනන් අලහප්පෙරුම විජේසිංහගේ අරුන් ප්‍රදීප් නිරෝෂන්, එන්ආර්එක්ස් 3003, ශ්‍රීලංනාහ
ලුතිනන් මහවෙල පතිරණගේ විජිත කුමාර, එන්ආර්එක්ස් 3006, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

11 - 659

2015 අංක 408

MOD/DEF/03/02/PRO/VNF/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 මැයි මස 05 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

වෛද්‍ය ලුතිනන් (ස්වේ) අසංග අබේනායක, එන්වීඩී 5703, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

11 - 658/1

---

# රජයේ නිවේදන

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/56/2014/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.11.27 වැනි දින සිට 2015.12.11 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.012.18 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ නාවල පිහිටි 'පැලැන්ගහවත්ත' නැමැති ඉඩමෙන් බෙදා වෙන්කළ ඒ අක්ෂරය - | 01. | කිව්. එම්. ආර්. ජයමාන්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.09.13 දින ලියා සහතික කරන ලද අංක 2151 දරන තෑගිකරය. |

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| 1056 වෙළුමේ<br>122 පත්ඉරුව. | දරන කැබැල්ලට ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන බලයලත් මානක විසින් 1973.07.09 දින මැන සාදන ලද අංක 2464 දරන පිඹුර ප්‍රකාර මායිම්,<br><br>*උතුර නැගෙනහිරට* : එන් මෙල්ට අයත් ඉඩම<br>*දකුණු නැගෙනහිර* : ලොට් සී<br>*දකුණු බටහිර* : 2 වැනි පටුමග<br>*උතුරු බටහිර* : නාවලගේ අල්විස් ඩයස්ට අයත් ඉඩම<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 15.5 | 02. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් 1976.03.29 දින ලියා සහතික කරන ලද අංක 3567 දරන තෑගිකරය.<br><br>03. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1977.04.27 දින ලියා සහතික කරන ලද අංක 3896 දරන තෑගිකරය.<br><br>04. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.07.24 දින ලියා සහතික කරන ලද අංක 4295 දරන ප්‍රකාශන ඔප්පුව.<br><br>05. ටී. ඩී. එම්. එස්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.12.07 දින ලියා සහතික කරන ලද අංක 3530 දරන තෑගිකරය. |
| කොළඹ දිස්ත්‍රික්කයේ,<br>දෙල්කඳ<br>ඉඩම් ලියාපදිංචි<br>කිරීමේ කාර්යාලයේ<br>එම් දරන කොට්ඨාසයේ<br>1056 වෙළුමේ<br>123 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ නාවල පිහිටි 'පැලැන්ගහවත්ත' නැමැති ඉඩමෙන් බෙදා වෙන්කළ සී අක්ෂරය දරන කැබැල්ලට ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන බලයලත් මානක විසින් 1973.07.09 දින මැන සාදන ලද අංක 2464 දරන පිඹුර ප්‍රකාර මායිම්,<br><br>*උතුරු නැගෙනහිර* : එන් ද මෙල්ට අයත් ඉඩම<br>*දකුණ නැගෙනහිර* : ලොට් බී<br>*දකුණු බටහිර* : 2 වැනි පටුමග<br>*උතුරු බටහිර* : ලොට් ඒ<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 02.1 | 01. කිව්. එම්. ආර්. ජයමාන්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.09.13 දින ලියා සහතික කරන ලද අංක 2151 දරන තෑගිකරය.<br><br>02. කිව්. එම්. ආර්. ජයමාන්න ප්‍රසිද්ධ නොතාරිස් 1973.09.13 දින ලියා සහතික කරන ලද අංක 2152 දරන තෑගිකරය.<br><br>03. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1976.03.29 දින ලියා සහතික කරන ලද අංක 3567 දරන තෑගිකරය.<br><br>04. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1977.04.27 දින ලියා සහතික කරන ලද අංක 3896 දරන තෑගිකරය.<br><br>05. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.07.24 දින ලියා සහතික කරන ලද අංක 4295 දරන ප්‍රකාශන ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ,<br>දෙල්කඳ<br>ඉඩම් ලියාපදිංචි<br>කිරීමේ කාර්යාලයේ<br>එම් දරන කොට්ඨාසයේ<br>1056 වෙළුමේ<br>250 පත්ඉරුව. | *උතුරු නැගෙනහිර* : එන් ද මෙල්ට අයත් ඉඩම<br>*දකුණ නැගෙනහිර* : ලොට් බී<br>*දකුණු බටහිර* : 2 වැනි පටුමග<br>*උතුරු බටහිර* : ලොට් ඒ<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 02.1 | 01. ටී. ඩී. එම්. එස්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.12.07 දින ලියා සහතික කරන ලද අංක 3530 දරන තෑගිකරය. |

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 638 වෙළුමේ 49 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ නාවල පිහිටි 'පැලැන්ගහවත්ත' නැමැති ඉඩමේ කොටසකට මායිම්,<br><br>*උතුර* : ජී. ඉසබෙලා කොස්තා හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක්<br>*නැගෙනහිර* : එම්. කොර්නේලිස් මාර්තිස් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක්<br>*දකුණ* : නාවල පාර<br>*බටහිර* : එම්. ඒ. මාරිස් මාර්තිස්ට අයිති මෙම ඉඩමේ කොටසක්<br>ප්‍රමාණය : අ. 00 රූ. 00, පර්. 21 485/1000 | 01. ඊ. ඩබ්. පී. වීරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1958.05.21 දින ලියා සහතික කරන ලද අංක 5992 දරන විකුණුම්කරය. |

11 - 685

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිෂ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1302400.
විජේසිංහගේ නිරෝෂන් ක්‍රිෂාන්ත ෆොන්සේකා, බර්නඩෙත් නිලන්ති ඩයස් කරුණාරත්න

2015 සැප්තැම්බර් මස 30වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2012 අගෝස්තු මස 14 වැනි දින සහතික කරන ලද අංක 4525 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේසිංහ නිරෝෂන් ක්‍රිෂාන්ත ෆොන්සේකා, බර්නඩෙත් නිලන්ති ඩයස් කරුණාරත්න ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි දහසයලක්ෂ හැත්තෑ හතරදහස් දෙසිය අසූ අට (රු. 1,16,74,288)ක මුදලක් 2015 අගෝස්තු මස 11 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි දහසයලක්ෂ හැත්තෑ හතරදහස් දෙසිය අසූ අට (රු. 1,16,74,288)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අගෝස්තු මස 12 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,12,.38,223ක මුදල මත 10.09%ක වැඩිපූර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 4525 දරන බැඳුම්කරය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩ්‍රොෆ් වීදියේ අංක 200හි 2 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාතලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### *උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ 522D පිටකෝට්ටේ ග්‍රාම නිළධාරි වසමේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුල පිටකෝට්ටේ හි පිහිටි පිටකෝට්ටේ සුභසාධක මාවතේ වරිපනම් අංක 38/7 දරන අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්.. ටී. අබේසිංහ විසින් 2009 නොවැම්බර් මස 01 වැනි දින සාදන ලද අංක 1701 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : අඩි 10ක් පළල පාර (පිඹුරු අංක 3715හි ලොට් 1E ) සහ එන්. ටී. බෝගහලන්දගේ ඉඩම ද, නැගෙනහිරට : මිනුම්පතිගේ අංක PP CO 5425 දරන පිඹුරේ ලොට් 5 ද, දකුණට : කේ. විජේසේකර සහ තවත් අයට අයිති ඉඩම ද සහ බස්නාහිරට : අංක 1701 දරන පිඹුර අනුව ඩී. රත්නපාලට සහ එල්. එස්. ද සිල්වා ට අයිති ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 1701 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිතුනයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 23.5)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත සඳහන් පිටකෝට්ටේ පිහිටි අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් 1986 අප්‍රේල් මස

08 වැනි දින සාදන ලද අංක 3715 දරන පිඹුරේ සඳහන් ලොට් 1C වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 1E සහ ලොට් 1B ද, නැගෙනහිරට : මිනුම්පතිගේ අංක 5425 දරන පිඹුරේ ලොට් 5 ද, දකුණට අංක 227 දරන පිඹුරේ ලොට් 4 ද සහ බස්නාහිරට : ලොට් 1D න්ද මායිම් වූ එකී අංක 3715 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිතුනයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 23.5)ක වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 2118/47 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර සඳහන් මාර්ග වෙන්කිරීම මතුපිටින් මගදිගේ හා ඒ තුල ගමන් කිරීමේ ඇති අයිතියද සමග වේ.

ඉහත සඳහන් පිටකෝට්ටේ පිහිටි අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් 1986 අප්‍රේල් මස 08 වැනි දින සාදන ලද අංක 3715 දරන පිඹුරේ සඳහන් ලොට් 1E (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 1A සහ ලොට් 1B ද, නැගෙනහිරට : ලොට් 1B සහ ලොට් 1C ද, දකුණට : ලොට් 1C සහ ලොට් 1D ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ එකී අංක 3715 දරන පිඹුර ප්‍රකරව පර්චස් තුනයි දශම හතයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 3.70)ක වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 886/291 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

2015 සැප්තැම්බර් මස 30 වැනි දින,

11 - 767

---

## මහජන බැංකුව - බොරැල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඇ දරන වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.10.30 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. ජී. ජයසූරිය මහත්මිය විසින් සහතික කරන ලද අංක 2008.03.31 වැනි දින අංක 662 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 658, බෙස්ලයින් පාර, කොළඹ 09 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථාපරිදි සංස්ථාගත කර ඇති සහ අංක 101/8, ග්‍රාම සංවර්ධන මාවත, පොල්වත්ත, පන්නිපිටිය යන ස්ථානයේ පිහිටි සමාගමක් වන ඔරැමික්ස් ඇස්පෝල්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 662 දරන උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකු වෙත රුපියල් මිලියන අටයි විසි අටදහස් දෙසීය හැත්තෑ පහයි ශත හතළිස් පහක් වූ මුදලක් (රු. 80,28,275.45) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද.

අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර (ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තු සමග 2014.09.15 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් මිලියන තුනයි හත් ලක්ෂ හැට පන් දහස් හාරසිය පනස් හතරයි ශත දහ අටක් වූ මුදලක් මත (රු, 37,65,454.18) වර්ෂයකට සියයට 26%ක් වූ පොළී මුදලක් ද, 2014.09.15 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් හයලක්ෂ නව දහස් එකසිය හැත්තෑ හතයි ශත අසූවක් වූ (රු. 6,09.177.80) මුදලක් මත වර්ෂයකට සියයට 26%ක් වූ පොළී මුදලක් ද සමග එකී රුපියල් මිලියන අටයි විසි අට දහස් දෙසීය හැත්තෑ පහයි ශත හතළිස් පහක් වූ මුදල (රු. 80,28,275.45) අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලියර්ස් ප්‍රදේශයේ, කොලොන්නාව මහ නගර සභා සීමාව තුළ වේරගොඩ, ගෙරාදෙනිපිටිය පාර හෙවත් වේල්ස් කුමාර පටුමග දෙසට ඇති පාර යනුවෙන් ද හඳුන්වනු ලබන ස්ථානයේ පිහිටා අත්තාවූ ද, "ගොයින්ස්ඩෝෆ්" හෙවත් "සියඹලාගහවත්ත" (වඩාත් නිවැරදි ලෙස) " දඹලගහවත්තවෙල" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1995 නොවැම්බර් මස 26 වැනි දින (1995 දෙසැම්බර් 20 වැනි දින) අංක 6326 දරන පිඹුරේ ලොට් අංක B3B ලෙස නිරූපණය කර ඇති උතුරට : අංක PPA 1327 දරන පිඹුරේ ලොට් අංක 6 ද, නැගෙනහිරට : ලොට් අංක B3C දරන කොටස ද, දකුණට : ලොට් අංක B3B දරන කොටස ද, සහ බටහිරට : එම ඉඩමේම ලොට් B2 දරන කොටසද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් වූ (අ. 0, රූ. 1, පර්. 20) ලොට් B3A දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම පහත දැක්වෙන ඉඩමේ මෑතකාලීන මැනීමක් වේ.

ඉහත කී ගෙරාදෙනිපිටිය පාර පිහිටා ඇත්තා වූ ද "ගොයින්ස්ඩෝෆ්" හෙවත් "සියඹලාගහවත්ත" (වඩාත් නිවැරදි ලෙස) "දඹලගහවත්තවෙල" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1991 පෙබරවාරි මස 6 වැනි දින අංක 5069 දරන පිඹුරේ ලොට් අංක B3A ලෙස ලකුණු කර ඇති උතුරට : මාර්ග පුලුල් කිරීම සඳහා අත්කර ගෙන ඇති ඉඩම වන PPA 1327 දරන පිඹුරේ ලොට් අංක 6 ද, නැගෙනහිරට : ලොට් B3C දරන කොටස ද, දකුණට : ලොට් B3B දරන කොටස ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් B2 දරන කොටස ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි

පර්චස් විස්සක් වූ (අ. 0, රූ. 0, පර්. 20) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ B 872/285 යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් B3A දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියල දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාප කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

11 - 787

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - බම්බලපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුවන්ගේ නම් : කැනීෂස් මනෝජ් වේදනායගම් සහ මුම්ටාස් (ඩි) වේදනායගම්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.10.28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, කැනීෂස් මනෝජ් වේදනායගම් සහ මුම්ටාස් (ඩි) වේදනායගම් විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන්ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන පී. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද 2012.02.08 දිනැති අංක 4884 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 14884 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2015.09.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළියද වශයෙන් රුපියල් එකොළොස් මිලියන දෙලක්ෂ අනූහතර දහස් අටසිය තිස් නවයයි ශත හතර (රු. 1,12,94,839.04) ක මුදල සහ 2015.09.04 වැනි දින සිට රුපියල් දස මිලියන නව ලක්ෂ හැට පන් දහස් නවසිය විසිනමයයි ශත විසි තුන (රු. 1,09,65,929.23)ක මුදල මත වාර්ෂිකව 15% බැගින් පොළියද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත් කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 4884 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් එකොළොස් මිලියන දෙලක්ෂ අනූ හතර දහස් අටසිය තිස් නවයයි ශත හතර (රු. 1,12,94,839.04 )ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 180/3 (50/3) හි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37හි කොළඹ 03, කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත, අංක 04හි දැන් ග්‍රීන්පාත් රෙසිඩන්සීස් යනුවෙන් හඳුන්වනු ලබනබලයලත් මානක එම්. බී. ආර්. ෆ්‍රැන්සිස් විසින් සකසන ලද අනුමත කළ 2004.05.16 දිනැති මිනුම් පිළිබඳ පිඹුරු අංක 1049හි ලොට් 1 වශයෙන් දක්වා ඇති නැවත මැනීමක් වන, බලයලත් මානක එම්. සී.එල්. සී. පෙරේරා විසින් සකසන ලද 2008 මාර්තු මස 27 දිනැති අංක 15/2008 දරන සභාධිපත්‍ය පිඹුරෙහි ප්‍රධාන නිදන කාමරය, නිදන කාමර දෙකක්, පැන්ට්‍රිය සේදීම කාමරය, වැසිකිළි තුනක්, සාලය සහ කෑම කාමරය, සදළුතලය කින් සමන්විත වූ ඉඩම් කැබැල්ලෙහි හයවන මහලේ පිහිටා ඇති එකී ඒකකය බී දරන ඉඩම් කැබැල්ලට මායිම් මෙසේය. උතුරට : මෙම ඒකකය ඕඑස්සීඊ (1)න් වෙන්කරන බිත්තියේ මධ්‍යය, නැගෙනහිරට : 5 වැනි මහලේ මෙම ඒකකය 'ඒ' ඒකකයෙන් වෙන්කරන බිත්තියේ මධ්‍යය සහ ඕඑස්සීඊ (1) සහ සීඊඑල්එෆ් (1) ද, දකුණට : මෙම ඒකකය සීඊ (පී7) සහ ඕඑස්ඊ (1)න් වෙන්කරන බිත්තියේ මධ්‍යය ද සහ බස්නාහිරට : මෙම ඒකකය 6 වැනි මහලේ සී ඒකකයෙන් වෙන්කරන බිත්තියේ මධ්‍යය සහ ඕඑස්සීසීඊ (1) ද, මුදුනින් : 7 වැනි මහලේ බී ඒකකයේ පොළොවෙහි මධ්‍යය ද, යටින් : මෙම ඒකකයේම බිම්තලයෙහි මධ්‍යය පී 57 අතිරේක ඒකකය (රථ ගාලේ වර්ග මීටර් 11.51) ඇතුළුව සම්පූර්ණ බිම් තලයෙහි වර්ගඵලය මීටර් එකසිය පනස් එකයි දශම හතයි හතරකි (ව.මී. 151.74), පොදු මූලාවයව ඇතුළුව නොබෙදූ කොටස් වටිනාකම - 1.56%කි.

(02) බිම් මහලේ පී 57 දරන රථ ගාල් කිරීමේ අතිරේක ඒකකය. පහත සඳහන් පරිදි වේ.

උතුරට : අතිරේක ඒකකය සහ ග්‍රීන් පාත් වරිපනම් අංක 48 සහ 50 වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, නැගෙනිහිරට : මෙම ඒකකය පී 56 අතිරේක ඒකකයෙන් වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම අතිරේක ඒකක සීඊ (1)න් වෙන්කරන ඉරෙහි මධ්‍යය ද, බස්නාහිරට : මෙම අතිරේක ඒකකය පී 58න් වෙන් කරන ඉරෙහි මධ්‍යය ද, මුදුණින් : අතුරු මහලෙහි බිම්තලයෙහි මධ්‍යය ද, යටින් : බිම් මහලේ බිම්තලයෙහි මධ්‍යය, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඒ 166/263හි ලියාපදිංචි කර ඇත.

ඕඑස්සීඊ (1), සීඊ (එස්ඩබ් 1), සීඊ (එල්එෆ් 1), සීඊ (පී 7), සීඊ (එල්එෆ් 2), සීඊ (එස්ඩබ් 2) වශයෙන් ලකුණු කළ පොදු මූලාවයවයන්හි අනුබද්ධ විවෘත ඉඩකඩ.

බලයලත් මානක එම්. සී. එල්. සී. පෙරේරා විසින් සකසන ලද 2008.03.27 දිනැති අංක 15/2008 දරන සහාධිපත්‍ය පිඹුරෙහි විස්තර කර ඇති පහත දැක්වෙන පොදු මූලාවයව සමගය.

පියසෙහි ටෙරසය :

(1) කොළඹ 03, ටී. ජී. ජයවර්ධන මාවත, වරිපනම් අංක 9/1 දරන පියසෙහි ටෙරසය,

(2) ඕඑස්සීඊ (1), සීඊ (එස්ඩබ් 1), එල්එෆ් (එල්එෆ් 1), සීඊ (එල්එෆ් 2), සීඊ (එස්ඩබ් 2), සීඊ (එස්එම්පී) සීඊ (ආර්ටී 1), සීඊ (ආර්ටී 2), සීඊ (ආර්ටී 3), සීඊ (ආර්ටී 4), සීඊ (ආර්ටී 5), සීඊ (ආර්ටී 6), සීඊ (ටීආර් 8), සීඊ (එල්බී) වශයෙන් ලකුණු කළ පොදු මූලාවයවයන්හී විවෘත ඉඩකඩ.

පොදු කරුණු :

(1) සහාධිපත්‍ය දේපළෙහි ව්‍යවස්ථාපිත පොදු මූලාවයව, 2003 අංක 39 දරන පනතින් සංශෝධිත, 1982 අංක 45 දරන (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, 1973 අංක 11 දරන සහාධිපත්‍ය හිමිකම් නීතියේ 26 වැනි වගන්තියේ ප්‍රතිපාදන සලසා ඇති පරිදිය.

(2) සහාධිපත්‍ය දේපළට අනුබද්ධ විවෘත ඉඩකඩ ඇතුළුව ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම,

(3) ගොඩනැගිල්ලේ අත්තිවාරම්, කොලම, බාල්ක, යටලී, ආධාරක, තරප්පු සහ තරප්පු පේළි. ගින්නෙන් බේරෙන මං, ඇතුල්වීමේ දොරටු, පිටවීමේ දොරටු ප්‍රධාන බිත්ති සහ ගොඩනැගිල්ලේ පියස.

(4) විදුලිය, දුරකථන, ගුවන් විදුලි, රෙඩිෆියුෂන්, ටෙලිවිෂන්, ජලනල, ජල ටැංකි, ජල දෙණ, ඉහළින් වූ ජල ටැංකි, පොම්පාගාර, ප්‍රණාලයන්, මළාපවහන මාර්ග, මනුබිල සහ අපද්‍රව්‍ය ඉවත්කිරීම වැනි මධ්‍යම සේවාවන් සඳහා කරන ලද සවිකිරීම්.

(5) දේපලෙහි පැවැත්මට, නඩත්තුවට, ආරක්ෂාවට හෝ පොදු භාවිතය සඳහා අවශ්‍යවන අනෙකුත් සියලුම සමකයන් සහ පහසුකම්ය.

සීඊ (1)

(අ) සහාධිපත්‍ය දේපළෙහි බිම් මහලෙහි ඉඩමය.

(ආ) ගොඩනැගිල්ලේ වාතාශ්‍රය සඳහා භාවිතා වන හිස් ඉඩකඩ.

(ඇ) මෙම ඉඩම රථ ගාල් කිරීමට - ඇවිදගෙන සහ දිවගෙන යාමටය.

(ඈ) ගොඩනැගිල්ලේ සියලුම ඒකකයන් සඳහා ආසන්නතම පොදු පෙදෙසට පිවිසුමය.

සීඊ (ටීඑල්) :

(අ) ගොඩනැගිල්ලේ සියලුම ඒකකයන් සඳහා භාවිතා කිරීමට වූ සහාධිපත්‍ය දේපළෙහි බිම් මහලේ වැසිකිළිය.

සීඊ (ජීආර්) :

(අ) ගොඩනැගිල්ලේ සියලුම ඒකකයන් සඳහා භාවිතා කිරීමට වූ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ස්ථානය.

සීඊ (එස්ඩබ් 1) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි තරප්පු පෙළය.

(ආ) ගොඩනැගිල්ලේ සියලුම ඒකකයන් සඳහා භාවිතා කිරීමටය.

සීඊ (එල්එෆ් 1) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි සෝපානය.

(ආ) ගොඩනැගිල්ලේ සියලුම ඒකකයන් සඳහා භාවිතා කිරීමටය.

සීඊ (එස්ඩබ් 2) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි පඩි පෙළය.

(ආ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි සියලුම ඒකක විසින් භාවිතා කිරීම සඳහාය.

සීඊ (එල්එෆ් 2) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි සෝපානය.

(ආ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි සියලුම ඒකක විසින් භාවිත කිරීම සඳහාය.

සීඊ (ආර්එම්) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි සියලුම ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ කාමරය.

සීඊ (පී1) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි අතුරු මහලේ ඒ, සී, ඩී. ඊ සහ එච් ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ අතුරු මහලේ පැසේජය (ගමන් මග).

සීඊ (පී 2) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි පළමුවන මහලේ ඒ, බී, සී, ඩී. ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ පළමුවන මහලේ පැසේජය (ගමන් මග).

සීඊ (පී3) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි දෙවන මහලේ ඒ, සී, ඩී. ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ දෙවන මහලේ පැසේජය (ගමන් මග).

සීඊ (පී4) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි තුන්වන මහලේ ඒ, සී, ඩී., ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ තුන්වන මහලේ පැසේජය (ගමන් මග).

සීර් (පී5) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි හතරවන මහලේ ඒ, සී, ඩී. ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ හතරවන මහලේ පැසේජය (ගමන් මග).

සීර් (පී6) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි පස්වන මහලේ ඒ, සී, ඩී. ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ පස්වන මහලේ පැසේජය (ගමන් මග).

සීර් (පී7) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි හයවන මහලේ ඒ, සී, ඩී. ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ හයවන මහලේ පැසේජය (ගමන් මග).

සීර් (පී8) :

(අ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය දේපළෙහි හත්වන මහලේ ඒ, සී, ඩී. ඊ, එෆ් සහ ජී ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ හත්වන මහලේ පැසේජය (ගමන් මග).

සීර් (ආර්ටී 1) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසය සහ 8 වන මහලේ ඒ ඒකකය සහ පියස ටෙරසයේ අනුබැදි ඒකක විසින් භාවිතා කිරීම සඳහාය.

සීර් (ආර්ටී 2) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසය සහ ගොඩනැගිල්ලේ සියලුම ඒකක විසින් භාවිතා කිරීම සඳහාය.

සීර් (ආර්ටී 3) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ පියස ටෙරසයේ ආවරණය කළ ක්‍රීඩා කිරීමේ ප්‍රදේශය සහ ගොඩනැගිල්ලේ සියලුම ඒකක විසින් භාවිතා කිරීම සඳහාය.

සීර් (ආර්ටී 4) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසය සහ 8 වන මහලේ බී ඒකකය සහ පියස ටෙරසයේ අනුබැදි 'බී' ඒකකය විසින් භාවිතා කිරීම සඳහාය.

සීර් (ආර්ටී 5) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසය සහ 8 වන මහලේ සී ඒකකය සහ පියස ටෙරසයේ අනුබැදි 'සී' ඒකකය විසින්ද භාවිතා කිරීම සඳහාය.

සීර් (ආර්ටී 6) :

(අ) ගොඩනැගිල්ලේ සියලුම ඒකක විසින් භාවිත කිරීම සඳහා වූ සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසයේ පොදු ඉඩ ප්‍රදේශය.

සීර් (ආර්ටී 7) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසය සහ 8 වන මහලේ ඩී ඒකකය සහ පියස ටෙරසයේ අනුබැදි 'ඩී' ඒකකය විසින්ද භාවිතා කිරීම සඳහාය.

සීර් (ආර්ටී 8) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියසෙහි ටෙරසය සහ 8 වන මහලේ ජී ඒකකය සහ පියස ටෙරසයේ අනුබැදි 'ජී' ඒකකය විසින්ද භාවිතා කිරීම සඳහාය.

සීර් (එස්එම්පී) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි සියලුම ඒකක විසින් භාවිතා කිරීම සඳහා වූ පිහිනුම් තටාකය වේ.

සීර් (එල්බී 1) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි බිම් මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීර් (එල්බී 2) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි අතුරු මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීර් (එල්බී 3) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පළමුවන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීර් (එල්බී 4) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි දෙවන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීර් (එල්බී 5) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි තුන්වන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීර් (එල්බී 6) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි හතරවන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීඊ (එල්බී 7) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පස්වන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීඊ (එල්බී 8) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි හයවන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීඊ (එල්බී 9) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි හත්වන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීඊ (එල්බී 10) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි අටවන මහලේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීඊ (එල්බී 11) :

(අ) සහාධිපත්‍ය දේපළෙහි පියස ටෙරසයේ ලොබි ප්‍රදේශය, සහාධිපත්‍ය දේපළෙහි ගොඩනැගිල්ලේ සෝපානයට සහ තරප්පු පෙළට ආසන්නතම පොදු ප්‍රදේශ පිවිසුමය.

සීඊ (ජීඑස්) :

(අ) ගොඩනැගිල්ලේ සියලුම ඒකකවලට ගෑස් සැපයීම සඳහා වෙන් කළ ප්‍රදේශය.

පී 1 සිට පී 61 දක්වා :

(අ) සහාධිපත්‍ය දේපළෙහි බිම් මහලේ රථගාල් කිරීමේ අංගනයයි.

එකී සහාධිපත්‍යය ගොඩනැගිල්ල පහත සඳහන් ඉඩමෙහි පිහිටා ඇත.

බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත කොල්ලුපිටිය, කොට්ඨාස අංක 37හි, කොළඹ 03, කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත, අංක 04හි මහල් අටකින් සමන්විත වන දැන් ග්‍රීන්පාත් රෙසිඩන්සීස් යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මානක එම්. ඩී. බී. ආර්. ෆ්‍රැන්සිස් විසින් සකසන ලද අනුමත කළ 2004.05.16 දිනැති මිනුම් පිඹුරු අංක 1049හි ලොට් 1 වශයෙන් දක්වා ඇති නැවත මිනීමක් වන, බලයලත් මානක එම්. සී. එල්. සී. පෙරේරා විසින් සකසන ලද 2008 මාර්තු මස 27 දිනැති අංක 15/2008 දරන සහාධිපත්‍ය පිඹුරෙහි දක්වා ඇති බිම් මහලක්, අතුරු බිම් මහලක්, පළමුවන මහල, දෙවල මහල, තුන්වන මහල, හතරවන මහල, පස්වන මහල, හයවන මහල, හත්වන මහල සහ පියස ටෙරසයකින් යුත් අටවන මහල ඇතුළත් බද්ධ ගෙබිම් කොටස් හැටකින් (60) යුත් (මින්මතු ග්‍රීන්පාත් රෙසිඩන්සීස් යනුවෙන් හඳුන්වනු ලබන) සහ අංක 15/2008 දරන සහාධිපත්‍ය පිඹුරෙහි දක්වා ඇති අනෙකුත් සංයෝජ්‍ය කොටස් වලින් සමන්විත, බිම් මහල : ඉහත පී1 සිට පී 61 දක්වා වූ රථගාල් කිරීමේ අංගන සහ සහාධිපත්‍ය පිඹුරෙහි දක්වා ඇති පොදු මූලාවයවයන්ද, අතුරු මහල : සහාධිපත්‍ය ඒකක සී, ඩී, ඊ සහ එච් ද, පළමුවන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ. බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද, දෙවල මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී, ඩී, ඊ, එෆ් සහ ජී ද, තුන්වන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද, හතරවන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද, පස්වන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද, හයවන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද, සත්වන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද. අටවන මහල : සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ, බී, සී , ඩී, ඊ, එෆ් සහ ජී ද, පියස ටෙරසය : ඒයූඒ. 1, ඒයූබී 1, ඒයූසී 1, ඒයූඩී 1, ඒයූජී 1, සහාධිපත්‍ය ගෙබිම් ඒකක ඒ. බී. සී , ඩී, ඊ එෆ් සහ ජී ද සමග එකී සහාධිපත්‍ය පිඹුරේ ලකුණු කර ඇති පොදු මූලාවයවයන් හී අනුබැඳි විවෘත ඉඩකඩ සහ එකී ලොට් 1 ට මායිම් උතුරට : ග්‍රීන් පාත් වරිපනම් අංක 48 සහ 50 ද, නැගෙනහිරට : කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත ද, දකුණට : කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත වරිපනම් අංක 4ඒ ද (බලයලත් මානක සී. ද එස්. ගුණතිලක සකස් කල අංක 2278 පිඹුරේ ලොට් 2) ද සහ බස්නාහිරට : ක්ලිෆඩ් පාර වරිපනම් අංක 8 ද (බලයලත් මානක ජේ. පී. මැලනි ගේ 1941.04.13 දිනැති අංක 739 පිඹුරෙහි ලොට් ඊ) ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි එකයි දශම පහ (අ. 0, රූ. 1, පර්. 21.50) ක් හෝ හෙක්ටෙයාර් බින්දුවයි දශම එකයි පහයි, පහයි පහ (0.1555)ක් වූ සහ ඉහත කියන ලද සහාධිපත්‍ය ගෙබිම් සහ අනුබද්ධ ඒකක වූ කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම පත්‍රිරු ඒ 166/181හි ලියාපදිංචි කරන ලද ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරාන්ත් රොද්‍රිගු,
කළමනාකරු - අයකර ගැනීම්.

11 - 789

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.